අග්නියේ උපන් දාසෙන්කැලි මහරජ

<u>හෙළ පුරාතනයේ ධාතුසේන කුමාරයාගේ කතාවේ පළමු ලිපිය</u>

- නිර්මාණය :- ඩබ්.එන්.ඩී ධනුෂ්ක සංජය -

යම් රටෙක රජ කෙනෙක් වීද, එය ලඝු කොට සිතිය නොහැකිය. අතීතයේ පැවති රාජ්‍ය පාලන පිළිවෙත අනුව බැලූ කල, රජු මත පැවරුණුයේ සුළු පටු වගකීමක් නොවේ. එය හරි ආකාරව ඉටු කොට මේ ලක් දෙරණේ චිර පැවැත්මට අත් දුන්නෝ සේම, අභ්‍යන්තර ආරවුල් මත හෝ බල තන්හාව මත හෝ අන් කවර හේතූන් මත හෝ වේවා, අතීත හෙළ මහා වංසයේ අඳුරු පරිච්ඡේදයන් තනන්නට තුඩු දුන් පාලකයෝද නොසිටියා නොවේ. රාජ්‍ය වර්ෂ 431ට පසු අවධියත් එසේය. ඒ අනුරාධපුර රාජධානියෙ ඛේදජනකම සැන්දෑවකි. අනුරාධපුර රාජධානිය එකළ රජකම් කළ මිත්‍රසේන රජ බලවත් පාලකයකු නොවීය. මිත්‍රසේන රජුට පූර්ව පාලන තන්ත්‍රය හෙබ වූ ඡත්තගාගහක නම් රජු සිහසුන ලබා ගනු ලැබ ඇත්තේ එකල පැවති සිරිතට පටහැනිව යමිනි. හෙතෙම මළ දින, මිත්‍රයෙකු වූ චත්ත නම් ඇමතියා රජුගේ අභාවයෙන් පසු මේ මිත්‍රසේන රජු සිහසුන තැබීය. මේ හේතූන් නියාවෙන් දෝ චත්ත ඇමතියා වටා මිත්‍රසේන රජු පාලන තත්ත්‍රය තුල බලයක් ඇති විය. රට අල්ලා ගැනීමට කුරුමානම් අල්ලමින් හුන් දකුණු ඉන්දීය ආක්‍රමණිකයන්ට මෙකළ පැවති වියවුල්කාරී පාලන ක්‍රමය උනුනට උචිතම මොහොත විය. චත්ත ඇමතියාගේ අනුදැනුම මත වාසල ආක්‍රමණය කළ දකුණු ඉන්දීයන් හා හෙළයන් අතර මහා සටන් ඇතිවිය. රහසේම වූ ආක්‍රමණයක් හේතුවෙන්ද වාසල වටලා පහරදීම හේතුවෙන්ද මිත්‍රසේන රජුගේ සේනාවට උන් මැඩලීමට නුපුළුවන් විය. යුද්ධය අහිමි වනු කණවැටුණු රජතෙමේ රහසේ පලායාමට සැරසුනද එය නිෂ්ඵල විය. පරතෙරින් ආ පණ්ඩු නම් පාණ්ඩ්‍යා, රජු නසා සිහසුන ලබා ගත්හ. පණ්ඩු රජු ඇතුළුව පාණ්ඩ්‍යයෙන් ආ පාරින්ද, බුද්ද පාරින්ද, තිරීතර, දාඨීය, පීඨීය නම් පාණ්ඩ්‍යන් සය දෙනකුද පැමිණි වග මහා වංසයේ දැක්වෙයි. යම් සිංහල මූලාශයන්ගේ එහි සත් දෙනෙකු ලෙස දැක්වූවද මහාවංසයේ එවැන්නක් සඳහන් නොවේ. උඩරට ද්‍රවිඩ පාලනයට යට වූ නියාවෙන් සියලු කුලවත් සිංහලයෝ රෝහණයට (රුහුණට) පලා ගිය.



උඩරට මෙම අග්නිජාලා ඇවිලෙන කල, නන්දිවාපි නම් ග්‍රාමයේ ධාතුසේන නැමැති මෞර්‍යවංශික කුටුම්බිකයකු රහසේ විසීය. ඊටත් වඩී තුන්සියයකටත් ඉහත දී සුභ නම් රජ දවස එ රජුගේ ක්‍රියා කලාපයෙන් බිය වූ මෞර්‍යවංශික කුටුම්බිකයෝ නේක තැන ගොස් රහසේ සැඟවිණ. මෙකල් වන විට කිසිදු මෞර්‍යවාංශික කුටුම්බියෙකු පණැතිව වෙසෙන වගක් කිසිවකුත් දැන නුහුන්නාය. ධාතුසේනගේ පුත් වූයේ දාඨ කුමාරයයි. හෙතෙම බෝධිගුප්ත වංසක්කාර විජුලා දේවිය හා කුටුම්බික ව අම්බිලයාගු ගාමයේ විසීය. පෙර දවස දේවානම්පියතිස් රජ සමයේ මහා බෝධීන් වහන්සේ ලක්දිවට වැඩම වූ සේක. එහිදී සඝමිත් තෙරණිය සමඟ ආ පිරිසෙහි අටලොස් කුලයක් විය. ඒ අතරින්ද රාජ කුල අටකි. එම අට කුලයන්ගෙන් එක් කුලක් වන බෝධිගුප්ත රාජ කුලයේ විජුලා දේවී උපත ලැබීය. ඈගේ බාල සෙහොයුරෙකු රජ උරුමැතිව ජන්මය ලැබුවද, කුමාරයෝ ගිහි සැප අතගැර චීවර දරා මහානාම තෙරුන් නමින් පැවිදි විය. අනතුරුව උරුමය විජුලා දේවී සතු විය. මෙසේ දාඨ කුමරු හා විජුලා දේවී යන දෙදෙනට පුත් රුවනක් උපන්නේය. පීතෘ පෙළපතින් මෞර්‍යවාංශික වූද, මව් පෙළපතින් බෝධිගුප්ත රාජ වාංශික වූද ලෙසින් උභයකුල පාරිශුද්ධව උපන් කුමරුන්ට සිය පිතාමහ ගේ නම් ඇතිව ධාතුසේන යැයි නම් තැබීය. මෙලෙසින් රජරට දකුණු ඉන්දීය පාලකයින්ගේ පාලනයට යටත්ව හෙළ වැසියන් බියෙන් පරදේසි රජුන්ට ගැතිකම් කරෙමින් හුන් කලෙක, නන්දිවාපි ගාමයේ හෙළ රාජ උරුමයැති කුමාරයෙක් මෙලෙස බිහිවිය. මෙබැව් වාසල කණවැටුණහොත් කුමරා සොයා විත් සියල්ලන් නසා ඔටුන්න හිමි බිළිඳු කුමරාද කඩු පහරින් හෙලනු ඇතැයි මව්පියෝ බියෙන් පසු විය. එ නියාවෙන් එය සියල්ලක්ගෙන්ම සඟවා කුමාර තෙමෙ හදාවඩා ගත.



කුමාරයන් කෙමෙන් කෙමෙන් වැඩෙත්ම රහසේම සටන් ශිල්පයන්ට අත හුරුකරවිය. තම මව්පියන්ට මහත් වූ දයාවෙන් ලෙන්ගතුව හැදී වැඩුණු කුමාර තෙමේ දෙමව්පිය බසට කීකරුව ආරක්ෂා ඇතිව කල් ගෙවීය. දාඨ හා විජුලා දේවි කුමරා පිළිබඳ නිරත්තර විමසිල්ලෙන් පසු විය. කුමරුන් ගමේ අනෙකුත් දරුවන් හා රංචු ගැසෙන්නට හැරියේද විරල අයුරිනි. එසේ යැව්වෙවිද දාඨ ඒ අසලටම වී හුන්නේය. මෙසේ කල් ගෙවී ගිය. සිය පාලන බලය උඩරටට පමණක් සීමා වූ පණ්ඩු රජ අනෙකුත් පෙදෙස් වලටද සිය අනසක පතුරා ප්‍රභල පාලකයෙකු වීමේ අදිටනින් යුතුව පසුවිය. කුමාරයාගේ ආරක්ෂාව පිළිබඳ දෙගිඩියාවෙන් පසු වූ දෙමාපියන් ඒ කුමරා පැවිදි කරවිය. විජුලා දේවීන් ගේ එක කුස උපන් තම පැවිදි සොහොයුරු වූ මහානාම තෙරුන් කෙරේ ගොස් දීඝසන්‍ද පිරිවෙනේදී ධාතුසේන කුමාරයා මහණ කරවිය. එතැන් පටන් කුමාර තෙමේ සංඝරත්නයේ රැකවරණ මැද පිරිවෙන් විහාරයන්ගේ විසීය. කුමාර තෙමේ මහණ කිරීමෙන් අනතුරුව විජුලා දේවිය තවත් පුත් කුමාරයෙකු හා කුමරියක් වැදුවාය. බාල කුමාර තෙමේ සිලාතිස්සබෝධි නම් විය. උන් දෙමාපිය රැකවරණ ඇතිව හැදීවැඩුනෝය. දිනෙක ධාතුසේන කුමාර හිමිනම වනාපොත් කරමින් හිඳින කල මහා වැසි ඇද වැටිණ. එකල් හී මහා නාගයකු පැමිණ උන්වහන්සේ වටා දරණ ගසා හිසට ඉහළින් පෙන ගොබය පා අනෝරාවෙන් හිමි නමත් පුස්තකයත් ආරක්ඛා කල බැව් මහානාම හිමියෝ දුටු වග මහාවංසයේ සඳහන් වේ. මෙම ගුප්ත සිදුවීම යම් යම් අයුරින් ඇතැම් පොත පත විග්‍රහ කොට ඇත්තේය. මහාවංසයේ සඳහන් අන්දමට මේ කුමාරයා කෙරේ නාගයෙකුගේ මැදිහත්වීමක් සහිත සිදුවීම් තවද ඇත්තේය. යම් විටෙක මෙලෙසින් නාගයා යැයි මහාවංසයේ සඳහන් කොට ඇත්තේ කුමරුන්ට රැකවරණ සැලසූ නාග ගෝත්‍ර කුලයක් සහිත ආරක්ෂකයෙක්ද විය හැක. මක් නිසාද යත් මහා බෝධිය වැනි හෙළයින්ගේ වටිනා පූජනීය වස්තූන් රැක ගැනීමට අතීතයේ නාග ගොත්‍රික මනුස්ස කොට්ඨාසයක් සිටි බැව් ඉතිහාස මූලාශයන්ගේ සඳහන්ව ඇති නිසාවෙනි.

දෙවැනි ලිපියට.....

